# උත්ථාන සමයේ සත්වන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 19 : 1–8

**"ඔබ අදහාගත් කල ශුද්ධාත්මයාණන් ලැබුවාහු ද?"**

තවද, අපොල්ලොස් කොරින්තියෙහි සිටියදී පාවුලු ඉහළ පළාත් මැදින් ගමන් කොට, එපීසියට පැමිණියේය. එහිදී ඔහුට සමහර ගෝලයෝ හමු වූහ. පාවුලු ඔවුන් අමතා, "ඔබ අදහා ගත් කල ශුද්ධාත්මයාණන් වහන්සේ ලැබුවාහුදැ" යි ඔවුන්ගෙන් ඇසීය. ඔව්හු "නැත, ශුද්ධාත්මයාණන් වහන්සේ ඇති බවක් වත් නොඇසීමු" යි කීහ. "එසේ වී නම් ඔබ කුමන බෞතීස්ම ස්නාපනයක් ලැබුවාහුදැ" යි ඔහු ඇසීය. "ජුවාම්ගේ බෞතීස්ම ස්නාපනය" යි ඔව්හු කීහ. පාවුලු කතා කොට "ජුවාම් මනස්ථාපනයේ බෞතීස්ම ස්නාපනයෙන් බෞතීස්ම ස්නාපනය කොට සෙනඟට කතා කරමින්, තමන්ට පසුව එන තැනැන්වහන්සේ කෙරෙහි එනම් ජේසුස් වහන්සේ කෙරෙහි අදහගන්නා ලෙස සෙනඟට කීවේ" යි පැවසීය.

ඔව්හු ඒ අසා ස්වාමින් වන ජේසුස් වහන්සේගේ නාමයෙන් බෞතීස්ම ස්නාපනය කරනු ලැබූහ. පාවුලු ඔවුන් මත අත් තැබූ කල ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණි සේක. ඔව්හු අන්‍ය භාෂා වලින් කතා කරමින් දිවැස් වැකි පැවසූහ. ඒ මනුෂ්‍යයෝ දොළොස් දෙනෙක් පමණ වූහ. පාවුලු ධර්ම ශාලාවට ඇතුළු වී තුන් මසක් අතරතුර

දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන නිර්භීත ලෙස තර්ක කරමින් ද සිත් දිනා ගැනීමට උත්සාහ කරමින් ද සාකච්ඡා කළේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 68: 1–6

පිළිතුර: මුළු ලොවෙහි රාජ්‍යයෙනි, දෙවිඳුන් හට ගායනා කරන්න.

ගීය: දෙවිඳාණෝ නැඟිට සතුරන් විසුරුවා හරින සේක.
එතුමන්ට වෛර කරන්නෝ එතුමන් ඉදිරියෙන් පලා යන්නෝය.
සුළඟට ගසාගෙන යන දුමක් මෙන් එතුමාණෝ ඔවුන් පහ කරන සේක. ගිනි ළඟ දිය වන ඉටි මෙන්
දෙවිඳුන් අබිමුව දුදනෝ වැනසී යෙත්වා!

එහෙත් දැහැමියෝ දෙවිඳුන් අබිමුව ප්‍රීති ප්‍රමෝද වෙත්වා!
ප්‍රීතියෙන් කුල්මත් වී ගී ගයත්වා!
දෙවිඳුන්ට ගී ගයන්න. එතුමන්ගේ නම කියා එතුමන් පසසන්න. වලාකුළු අරා වඩින සමිඳාණන් හට මාවතක් පිළියෙල කරන්න. එතුමන්ගේ නාමය සමිඳාණෝ ය. එතුමන් අබිමුව ප්‍රීතියෙන් සිටින්න.

එතුමාණෝ අනාථයන්ගේ පියාණෝ ද
වැන්දඹුවන්ගේ ආරක්ෂකයාණෝ ද වන සේක.
සිය ශුද්ධ නිවාසයෙහි වසන එතුමාණෝ දෙවිඳාණෝය. දෙවිඳාණෝ අනාථ වූවන්ට නිවෙස් තනා දෙන සේක. හිරකරුවන්ට නිදහස දෙන සේක. එහෙත් කැරලිකරුවන් මරු කතරේ විසීමට හරින සේක.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න.
පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද
නාමයෙන් ඔවුන් බෞතීස්ම ස්නාපනය කරන්න.
මම ද සදහට ම ඔබ සමඟ සිටිමි" යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 16: 29 – 33

**“දිරිමත් වන්න. මම ලොව ජය ගතිමි.”**

ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෝ කතා කොට, “ආ, දැන් ඔබ උපමා මගින් නොව, පැහැදිලි ලෙස කතා කරන සේක. ඔබ සියල්ල දන්නා බව ද කිසිවකු ඔබගෙන් ප්‍රශ්න අසන්න නුවුමනා බවද දැන් අපි දනිමු. මෙයින් ඔබ දෙවියන් වහන්සේ කෙරෙන් පැමිණි බව අපි විශ්වාස කරමු” යි කීහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, “ඔබ දැන් විශ්වාස කරන්නහුද? ඒ කෙසේ වෙතත් ඔබ මා තනිකර දමා, තම තමන්ගේ තැන්වලට විසුරුවනු ලබන පැය පැමිණෙන්නේ ය. දැනටමත් එය පැමිණ තිබේ. එසේ වුවත් පියාණන් වහන්සේ මා සමඟ සිටින බැවින් මම තනි නොවෙමි. මේ දේවල් මා ඔබට කීවේ මා තුළ ඔබට ශාන්තිය ඇතිවන පිණිසය. ලෝකයෙහි ඔබට දුක් ගැහැට තිබේ. එහෙත් ධෛර්යයවත් වන්න. මම ලෝකය අභිබවා ජය ගතිමි” යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.